ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1982 අංක 30 දරන

# ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 අගෝස්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 45 යි — තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1982 අංක 30 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 27/76

**ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය යන නාමයෙන් සහ අභිධානයෙන් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව ස්වකීය පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නැසීගිය පණ්ඩිත ජී. පී. වික්‍රමාරච්චි විසින් "ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය" යනුවෙන් හැඳින්වෙන විද්‍යාලයක් මෙතෙක් ගම්පහ පිහිටුවා කළමනාකරණය කරනු ලැබ ඇති හෙයින් ද :

එකී විද්‍යාලය විසින් ස්වකීය පරමාර්ථ මෙතෙක් සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර එහි සංවර්ධනය හා අඛණ්ඩ පැවැත්ම සහ මහජන යහපත සඳහා ස්වකීය සාමාජිකයන්ගේ එකඟත්වය ඇතිව එය සංස්ථාගත කරනු ලැබීම අවශ්‍ය හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

1. මේ පනත 1982 අංක 30 දරන ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය සංස්ථාගත කිරීම

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන්පසු ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ පාලක සභාවේ තත්කාලයෙහි සාමාජිකයන් සහ එකී ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ, මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවක් විය යුතු අතර සංස්ථාවට පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය තිබිය යුතු ය. තවද, එම නාමයෙන් සංස්ථාව විසින් සියලු අධිකරණයන්හි නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව, සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ස්වදේශීය, සිද්ධ සහ ආයුර්වේද වෛද්‍ය ක්‍රම ඉගැන්වීම සඳහා වූ පුළුල් ජාතික ආයතනයක් වශයෙන් විද්‍යාලය පැවැත්වීම සහ පරිපාලනය කිරීම;

(ආ) වෛද්‍ය ශිෂ්‍යයන් පුහුණු කිරීම සඳහා සහ රෝගීන්ට නොමිලේ වෛද්‍ය ආධාර සැපයීම සඳහා ආයුර්වේද රෝහලක් පිහිටුවීම;

ඒ 64321—14,775 (82/07)

(ඇ) ආයුර්වේද ක්ෂේත්‍රයෙහි ප්‍රවීණත්වය ලබා ඇති තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්ය සඳහා විභාග පැවැත්වීම ; සහ

(ඈ) විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට අවශ්‍ය උපකරණ සැපයීම සහ එම ගොඩනැගිලි පවත්වාගෙන යාම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීමේ, පවත්වාගෙන යාමේ සහ අවසාන කිරීමේ ද, ඇප ඇතිව හෝ නැතිව, මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවකයන් සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒවායින් යම් කිසිවක් හෝ සමෘද්ධ කර ගැනීම හෝ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන කවර වූ හෝ ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු පාලනය කිරීම.

**5.** (1) සංස්ථාවේ රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒවාට අනුකූලව තෝරා පත් කර ගන්නා ලද නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත පාලක සභාව විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී විද්‍යාලයේ පාලක සභාවේ ධුර දරන සාමාජිකයන්, සංස්ථාවේ පළමුවන පාලක සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී, එම රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන්, සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් නීතියක ප්‍රතිපත්ති සහ විධිවිධානවලට පටහැනි නොවන්නා වූ රීති කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනි රැස්වීමක දී ඒ ආකාරයට ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය විසින් ගෙවිය යුතු ණය හා එයට ගෙවනු ලැබිය යුතු ණය.

**7.** මෙම පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පවත්නා ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයේ සියලු ණය සහ වගකීම් සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලයට අයවිය යුතු සියලු ණය සහ ගෙවනු ලැබිය යුතු දායක මුදල් සහ ආධාර මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන් කිසිවක් හේතුකොට ගෙන සංස්ථාව සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් ලබා ගැනීමට හා දැරීමට නීත්‍යනුකූල ශක්‍යතාව සංස්ථාවට තිබිය යුතු ය. ඒ සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්යයන් සඳහා සහ සංස්ථාවේ රීති වලට යටත්ව දරනු ලැබිය යුතු ය ; තව ද, ඒවා විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම සඳහා පූර්ණ බලය සංස්ථාවට තිබිය යුතු ය. සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. සංස්ථාවේ රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි වූ තැනැත් තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර එම තැනැත්තන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි ඔවුන් විසින් ස්වකීය නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම යම් තැනැත් තකු සාක්ෂිකරුවකු ලෙස අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. (1) විද්‍යාලය පවත්වාගෙන යාම සහ එහි සුභසාධනය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලීය අරමුදල" නම් වූ අරමුද ලක් පිහිටුවනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) පාර්ලිමේන්තුව විසින් , කලින් කල, ඒ අරමුදලට මුදල් ප්‍රමාණ සම්මත කරනු ලැබිය හැකි ය.

(3) පාර්ලිමේන්තුව විසින් එසේ සම්මත කරනු ලැබූ මුදල් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත කාරක සභාවක අනුමැතිය ඇතිව සහ එහි අධීක්ෂණය යටතේ පමණක් වියදම් කරනු ලැබිය යුතු ය :—

(අ) කාරක සභාවේ සභාපතිවරයා විය යුතු ආයුර්වේද කොමසාරිස් වරයා ;

(ආ) පාලක සභාවේ සභාපතිවරයා ;

(ඇ) පාලක සභාවේ භාණ්ඩාගාරිකවරයා ;

(ඈ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ; සහ

(ඉ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයා හෝ ඔහුගේ නියෝජිතයා.

(4) අරමුදලේ ගිණුම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථා වට අනුකූලව විගණනය කළ යුතු ය.

11. මෙම පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන් කෙරෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිති වාසිකම් හැර, ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.